**පුත්තලම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනයකළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු.10,100,000 ක් වටිනා ට්‍රැක්ටරයක් හා ටිපර් රථයක් දෙවරක් වාහන ලේඛනයේ සටහන් කර තිබීම රු.1,533,495 ක් වූ අපහරණය කර තිබූ කැබ් රථයක වටිනාකම හා අනෙකුත් අමතර උපාංග වත්කම්වලින් ඉවත් නොකිරීම සහ එකතුව රු.69,070 ක් වූ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයන්ගෙන් ස්ථාවර වත්කම්වල අගය වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) රු.2,000,000 කට තක්සේරු කර තිබුණු අංක 56 – 4650 දරන කැබ්රථය වත්කම්වලින් අත්හැරී තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
-------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.10,789,698 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ඒවායේ එකතුව රු.6,763,641 ක් වූයෙන් රු.4,026,057 ක වෙනසක් විය. එමෙන්ම දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.26,263,222 ක් වූ අතර, එම අරමුදලේ ශේෂ තහවුරු කිරීමේ ලිපිය අනුව එය රු.30,828,200 ක් ව තිබුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්
-----------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.10,268,976 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.9,505,039 ක් විය. වර්ෂ ගණනාවක සිට අචලව පවතින ජංගම වත්කම්වල අගය රු.952,980 ක් විය.

**1.3.4 අයවීමට ඇති සේවක ණය**

2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂය රු.3,881,500 ක් වූ අතර, සේවය හැරගිය, ස්ථාන මාරුවී ගිය, මියගිය හා විශ්‍රාම ගිය සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.46,568 ක ණය මුදලක් වසර ගණනාවක සිට අයනොවී පැවතුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 52,978,405 ක් වූ ගිණුම් ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**1.3.7 අනුචිත හෙළිදරව් කිරීම්**

සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.218,265 ක් වටිනාකමැති විදුලි උපකරණ තොගය ලිපිද්‍රව්‍ය තොගය තුළ පෙන්වා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,576,410 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,401,064 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

<u>වියදම් ව්‍යුහය</u>

සමාලෝචිත වර්ෂයේ සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයයන් | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | |
| පෞද්ගලික පඩිනඩි | 76,404 | 42,979 | 33,425 |
| අනෙකුත් | 37,302 | 17,678 | 19,624 |
| උප එකතුව | 113,706 | 60,657 | 53,049 |

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | 142,000 | 16,237 | 125,763 |
| | --------- | --------- | --------- |
| මුළු එකතුව | 255,706 | 76,894 | 178,812 |
| | ===== | ===== | ====== |

සමාලෝචිත වර්ෂය තුළ පෞද්ගලික පඩිනඩි සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදලින් සියයට 44 ක් හා අනෙකුත් වියදම් සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදලින් සියයට 53 ක් ඉතිරිව තිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදලින් සියයට 89 ක් ඉතිරිවී තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය සභාව අධි ඇස්තමේන්තු සකස්කර තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **ආදායම් විෂයය** | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
|---|---|---|---|---|
| | | රු. **'000** | රු. **'000** | රු. **'000** |
| (අ) | වරිපනම් හා බදු | 8,000 | 1,284 | 3,552 |
| (ආ) | බදුකුලී, කඩකුලී | 13,000 | 7,355 | 6,093 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 5,500 | 3,954 | 904 |

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු, බදුකුලී හා කඩකුලී සහ බලපත්‍ර ගාස්තු යන සියලුම ආදායම් අයවීමේ පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කර තිබූ අතර, ඊට සමගාමීව හිඟ ආදායම් ද වර්ධනය වී තිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් හිඟ ආදායම් හා බිල්කල ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි විය.

| **ආදායම් ශීර්ෂය** | **2015.01.01 දිනට හිඟ ආදායම** | **හිඟයෙන් අයවීම** | **හිඟ අයවීමේ ප්‍රගතිය** | **වර්ෂය තුළ බිල්කල ආදායම** | **බිල්කල ආදායමින් අයවීම** | **අයවීමේ ප්‍රගතිය** |
|---|---|---|---|---|---|---|
| | රු. **'000** | රු. **'000** | % | රු. **'000** | රු. **'000** | % |
| වරිපනම් බදු | 3,235 | 450 | 14 | 1,163 | 421 | 36 |
| අක්කර බදු | 254 | 17 | 07 | 121 | 99 | 82 |
| බදු කුලී | 4,226 | -- | -- | 5,772 | 5,772 | 100 |
| කඩ කුලී | 693 | -- | -- | 802 | 769 | 96 |
| වෙළඳ බලපත්‍ර | 903 | -- | -- | 3,953 | 3,953 | 100 |

වරිපනම් බදු ආදායම රැස්කිරීම දුර්වල මට්ටමක පවතින නිසා වසරින් වසර හිඟ ආදායම වර්ධනය වීම කෙරෙහි එය බලපා තිබුණි.

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කර තිබූ උසාවි දඩ ආදායම රු.12,000,000 ක් වූ අතර, ජනවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා රු.8,752,567 ක් ලැබී තිබුණි. වර්ෂය සඳහා මුද්දර ගාස්තු ආදායම රු.8,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, ජනවාරි සිට අප්‍රේල් මාසය දක්වා පමණක් මුද්දර ගාස්තු රු.3,908,518 ක් ප්‍රාදේශීය සභාව ගෙන්වා ගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

ප්‍රාදේශීය සභාවට අයත් අංක RS – 1556 දරන මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලී පදනම මත පෞද්ගලික අංශයට හා වෙනත් රාජ්‍ය ආයතනවලට ලබා දීමෙන් 2009 වර්ෂයේ සිට 2014 අවසානය දක්වා පිළිවෙලින් රු.253,627 ක් හා රු.327,644 ක් වශයෙන් එකතුව රු.581,271 ක් අයකර ගැනීමට සභාවේ වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි. විගණනය විසින් සිදුකල ශේෂ තහවුරු කර ගැනීම් වලදී ඇතැම් ණය ශේෂ ගෙවීමට නොමැති බවට ආයතන හා පුද්ගලයින් කීපදෙනෙකු විසින් තහවුරු කර තිබුණු අතර, ඇතැම් ලිපිනයන් සොයාගත නොහැකි බවට තැපැල් දෙපාර්තමේන්තුව තහවුරු කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් මුල්‍ය රීති 97.4 ප්‍රකාරව අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

(ආ) වරිපනම් බදු තක්සේරුව සෑම වර්ෂ 5 කටම වරක් සිදුකළ යුතු වුවත්, 2006 වර්ෂයේ සිදුකරන ලද දේපල තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකිරීම නිසා සභාවට ලබාගත හැකිව තිබූ විශාල ස්වයං උත්පාදිත ආදායමක් අහිමි කරගෙන තිබුණි.

(ඇ) රාජ්‍ය නොවන සංවිධානයක් විසින් එකක් රු.11,500 ක බැගින් වූ ප්ලාස්ටිෂෙල් ජල ටැංකි 06 ක් සභාවට පරිත්‍යාග කර තිබූ අතර, ඒ පිළිබඳ තොරතුරු සභාවේ ලේඛන ගතකර නොතිබුණි. එම ජල ටැංකි ස්ථානගත කර ඇති ස්ථාන පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොකිරීමෙන් රු.69,000 ක් වටිනාකමැති ජල ටැංකි අවභාවිතයට ලක් වී ඇති බව නිරීක්ෂණය විය.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම**

----------------------------------------------------

පිළිසරු ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය හා ප්‍රාදේශීය සභාව ඇති කරගෙන තිබූ අවබෝධතා ගිවිසුමට අනුව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමට රු.8,400,000 ක් අනුමත වී තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.2,050,144 ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රාදේශීය සභාවට ලබාදී තිබූ අතර, සභාව රු.2,028,756 ක් ඉදිකිරීම්භාර කොන්ත්‍රාත්කාර ආයතනය වෙත ගෙවා තිබුණි. ව්‍යාපෘතිය අතරමඟ නවතා තිබූ අතර, වසර දෙකක්

පමණ තිස්සේ වැඩබිම සොරසතුරු ආක්‍රමණයන්ට හා ස්වභාවික ආපදාවන්ට නිරාවරණයව අතහැර දමා තිබුණි. වැයකර තිබූ රු.2,028,756 ක මුදල ඵලරහිත වියදමක් ලෙස විගණනයේදී හඳුනා ගැනේ. වර්තමානයේ දී කැලි කසල බැහැර කරලීම සභාවට අයත් ඉඩමක විවෘත බිමකට සිදුකරනු ලබන බවත් නිරීක්ෂණය විය.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ ද්විතියික ශ්‍රේණියේ තනතුරු 05 ක පුරප්පාඩුවක් පැවති අතර, ප්‍රාථමික ශ්‍රේණියේ 28 දෙනෙකු අතිරික්ත විය.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

--------------------------------------

## 4.1 අභ්‍යන්තර විගණනය

----------------------

සභාව විසින් පත්කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරීට අමතරව පළාත් පාලන විමර්ශන නිලධාරීන් විසින් ද වර්ෂය පුරාම අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර අදාල වාර්තා සභාව වෙත ලබාදී තිබුණි.

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම

----------------------------------------------

වයඹ ප්‍රධාන ලේකම්ගේ 2010 ඔක්තෝබර් 05 දිනැති අංක ව/ප්‍ර/ලේ/05/03 විගණන කමිටු දරන ලිපියට අනුව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කිසිදු රැස්වීම් වාරයක් හෝ පවත්වා නොතිබුණි.

## 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

----------------------------------------------

එකතුව රු.467,800 ක් වටිනා අංක SF – 9945, SF - 9114 හා SB – 8201 දරන අත්ට්‍රැක්ටර් තුන වර්ෂ 04 ත් 06 ත් අතර කාල පරාසයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි.

## 5. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන උපයෝජනය